# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 129 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 24/01/2024<br>පැය 1350 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් නිලධාරියෙකු ලෙස පෙනී සිටිමින් දුරකථනයෙන් තර්ජනය කර කප්පම් ලබා ගැනීම සම්බන්ධව සැකකරුවෙකු අත්අඩංගුවට - මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන කොට්ඨාසය.**

පොලිස් නිලධාරියෙකු ලෙස පෙනී සිටිමින් දුරකථනයෙන් තර්ජනය කර කප්පම් මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් ලද පැමිණිලි කිහිපයක් සම්බන්ධව මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් විමර්ශන සිදුකර කප්පම් මුදල් ලබා ගත් සැකකරු 2024.01.23 වන දින දහවල් කාලයේදී කඩවත පොලිස් වසමේ පහල බියන්විල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන කඩවත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන කඩවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු විසින් ව්‍යාපාරිකයින් වෙත දුරකථන ඇමතුම් ලබාගෙන ඔවුන් පාස්කු ප්‍රහාරයට සම්බන්ධ බවට ඔවුන්ගේ දුරකථන විශ්ලේෂණ වාර්තා අනුව තහවුරු වී ඇති බවට ප්‍රකාශ කර ඒ අනුව ඔවුන් අත්අඩංගුවට ගැනීමට ඇති බැවින් එසේ අත්අඩංගුවට ගැනීම සිදු නොකිරීමට නම් සැකකරු විසින් ලබා දෙන බැංකු ගිණුම් වෙත මුදල් බැර කරන ලෙස ප්‍රකාශ කර තර්ජනය කර ඇති බව සිදු කල විමර්ශනයේ දී, අනාවරණය වී ඇත.

පොලිසිය විසින් මේ ආකාරයට කිසිදු අවස්ථාවක දුරකථන ඇමතුම් ලබාගැනීමට කටයුතු නොකරන බවත් මහජනතාව ඒ සම්බන්ධයෙන් සැලකිලිමත්ව කටයුතු කරමින් එවැනි දුරකථන ඇමතුම් සම්බන්ධයෙන් පොලිසිය දැනුවත් කරන මෙන් මහජනතාවගෙන් ඉල්ලා සිටිමි.